## ගිණුම්කරණය 8.1 – නිපුණතාවය

**ලාභ අරමුණු කර නොගත් සංවිධාන යනු**

**සමාජ සුභසාධනය වැඩි දියුණු කිරීම, සාමජිකයන්ගේ අභිවෘද්ධිය හා අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීම යන ආදිය සිය මූලික අරමුණු කර ගත් සංවිධාන, ලාභ ඉපයීම අරමුණු කර නොගත් සංවිධාන ලෙස හැඳින්විය හැක.**

වෙළඳ කටයුතු එකී සංවිධාන වල ප්‍රධාන කාර්යය නොවන නිසා ඒවා වෙළඳ නොවන සංවිධානය ලෙස හැඳින්වේ.

උදා : **සුභසාධන සමිති, ක්‍රීඩා සමිති, වෘත්තිය සමිති, මරණාධාර සමිති ආගමික සංවිධාන, සහ රාජ්‍ය නොවන සංවිධාන**

**ලාභ අරමුණු කර නොගත් සංවිධාන ගිණුම් පිළියෙල කිරීමට හේතු**

- සාමාජිකයින් හා වෙනත් ඇල්ම ඇති පාර්ශ්ව දැනුවත් කිරීමට
- සාමාජික විශ්වාස පවත්වා ගැනීමට
- සංවිධානයේ ඉදිරි කටයුතු සැලසුම් කිරීමට
- සංවිධානයේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට

**ලාභ අරමුණු කර නොගත් සංවිධාන පිළියෙල කරන ගිණුම්**

ලාභ නොලබන සංවිධාන වල මෙහෙයුම් ප්‍රතිඵලය, මූල්‍යතත්වය, මුදල් ප්‍රවාහනය ලබා ගැනීමට පහත ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

- **ලැබීම් ගෙවීම් ගිණුම**
- **සාමාජික මුදල් ගිණුම**
- **ආදායම් ප්‍රකාශය**
- **මූල්‍යතත්ව ප්‍රකාශය**
- **බාහිර ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල ගණනය කිරීමේ ආදායම් ප්‍රකාශ**

**01.** ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් යනු කුමක්ද?

**02.** ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා උදාහරණ දක්වන්න.

**03.** ලාභ අරමුණු කර නොගත් සංවිධාන ගිණුම් පිළියෙල කරන්නේ ඇයි?

**04.** ලාභ අරමුණු කර නොගත් සංවිධාන පිළියෙල කරන ප්‍රධාන වාර්තා දෙකක් සඳහන් කරන්න.

**05.** ලාභ අරමුණු කර නොගත් සංවිධාන මුදල් පදනමට පිළියෙල කරන ගිණුම කුමක්ද?

**06.** සමිති සංවිධානයක ප්‍රධාන ආදායම් මාර්ගය කුමක්ද?

**07.** සමිති සංවිධාන විවිධ ආර්ථික කටයුතු වල නිරත වේ ඒවා තුනක් දක්වන්න.

**08.** පහත වගුව සම්පූර්ණ කරන්න.

| වාර්තා වර්ගය | පිළියෙල කිරීමේ අරමුණ |
|---|---|
| ආදායම් ප්‍රකාශනය | ........................................................................................ |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | ........................................................................................ |
| ලැබීම් ගෙවීම් ගිණුම | ........................................................................................ |
| සාමාජික මුදල් ගිණුම | ........................................................................................ |
| බාහිර ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය | ........................................................................................ |